ලංකාවේ වෘත්තීය සමිති ඊයේ අද සහ හෙට

ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ ඉතිහාසය ක්‍රි.ව 1893 තරම් අතට දිගේ. ප්‍රථම වෘත්තීය සංගමය වූ ලංකා මුදුණ කම්කරු සංගමය බිහිවනුයේ එම වසරේ දී ය. ඉන්පසු වැඩ වර්ජන රැල්ලක් පැතිර ගිය ද වෘත්තීය සමිති බිහි වීමකට එය වනරම් ඉඩ දෙන්නේ ද යන ප්‍රශ්නය පැන නගී. එබැවින් මෙරට වෘත්තීය සංගමී ගැන නවවන කතා කරනු ලබන්නේ ගුණසිංහයන්ගේ ආගමනයෙන් පසුව ය. ඒ.ඊ ගුණසිංහයන් විසින් 1922 දී පිහිටුවන ලද ලංකා කම්කරු සංගමය, මෙරට සංවිධානාත්මක වෘත්තීය සංගමී ව්‍යාපාරයේ ආරම්භය විය. පසුව ඔහු විසින් ම ඇති කරන ලද ලංකා වෙළඳ සේවක සංගමය, ඔහුගේ සභාපතිත්වයෙන් බැංකු සේවකයින් ඇති කළ ලංකා බැංකු ලිපිකාර සංගමය ආදී වෘත්තීය සමිති මෙරට ඉතිහාසයේ කම්කරු පන්තියට නායකත්වය ලබාදුන් දැවැන්ත බලවේග ලෙස පැවතිණි. වෘත්තීය සමිති අධිරාජ්‍යවාදී පාලකයන් හට නායාට අඳුකාළ මෙන් තිබී පසුව පිළිගන්නා ලද්දේත්, වෘත්තීය සමිති ව්‍යාපාරයට සමාන්තරව සේවායෙන්ගේ සම්මේලනය බිහි වන්නේත් සාමූහික ගිවිසුම් ඇති වන්නේත් කම්කරු පන්තියේ සංවිධානාත්මක බලය වූ වෘත්තීය සමිතිවල ක්‍රියාකාරීත්වය නිසා ය.

ශ්‍රී ලංකාවේ වෘත්තීය සංගමී ව්‍යාපාරය ගැන බලන විට පෙනී යන කරුණා වන්නේ එක් එක් වර්ගයානුවලට ආවේණික වීමක් තත්වයන් පැවති බව ය. ගුණසිංහයන් විසින් ආධිපත්‍යය දරන ලද යුගයේ දී ලංකා ජාතික සංගමයේ අයථ වඩා ඔහු සරන්කාර වීය. 1930 ගණන්වල ඊටත් වඩා සටන්කාමීන් වූ ලංකා සමසමාජ පක්ෂය බිහිකළ පැරණි වමේ පුරෝගාමීන් අතට වෘත්තීය සමිති බලය මාරු වන්නේ ගුණසිංහ අන්ත ප්‍රතිගාමීයකුගේ ගොඩට ඇද දමමිනි.

වෘත්තීය සමිතිවලට

සංවිධානාත්මක දේශපාලන නායකත්වයක් ලබා දෙන්නේ මේ පැරණි වමේ නායකත්වය විසිනි. ඊළඟ එවස්ථාවේ වම ක්‍රමානුකූලව කැබලිවලට කැඩී යන්නට පටන් ගත් ඊට වෘත්තීය සමිති ද කැබලිවලට කැඩී යන්නට පටන් ගනී. අද වන විට තත්වය ගෙන බැලූ ඊට පෙනී යන කරුණකි වන්නේ ගොඩ නඟාගෙන තිබුණු දේශපාලන පක්ෂ ලියෑම් ගොස් වෘත්තීය සමිති පමණක් ඉතිරි වී එය මුළුරොකාසි ව්‍යාපාරයක් ව ඇති බවයි.

මුලික වශයෙන් ගත් කල එක් යුගයක් දෙස 1933 දක්වා ගුණසිංහ යුගය හැඳින්වීය හැකි ය. ඊළඟ වාමාංශික යුගය 1980 වර්ෂයය දක්වා ඉදිරියට ඉළවී. 1980 සමස්ත මහා වැඩ වර්ජනයන් සමඟ ම පැරණි වමේ නායකත්වයෙන් පැවැති වෘත්තීය සමිති ව්‍යාපාරය ද ඇද වැටිණ. අද වට විට ඒක වෘත්තීය සමිති ව්‍යාපාරයේ නායකයෝ ආණ්ඩුවේ ඇමැති පදවිවල රස බලමින් සිටිනු දක්නට හැකි අතර, වෘත්තීය සමිති නායකයන් ආණ්ඩුව ආරක්ෂා කිරීමේ කොන්ත්‍රාත්තු බාරගෙන සිටිනු පෙනේ.

වාමාංශික පක්ෂවලටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පළමුවත්, එක්සත් ජාතික පක්ෂය ඊට පසුවත් තමන්ගේ ම වූ වෘත්තීය සමිති ඇති කර ගත් නමුත් ඒවායින් රටට හෝ කම්කරු පන්තියට සිදු වූ සෙසක් නොමැකි බැවින් එම වෘත්තීය සමිති ගැන දීර්ඝ කරුණු හැදෑරීමක අවශ්‍යතාවයක් පැන නොනගී. විශේෂයෙන් සඳහන් කරන්නේ හමි ජාතික සේවක සංගමය එපාත පාලන සමයේ හැසිරුණේ ආණ්ඩු විරෝධී ක්‍රියාමාර්ග කඩාකප්පල් කරන මැරයකුගේ ආකාරයෙනි. එකල සුප්‍රසිද්ධ තත් සංස්ථාව ගොඩ නැඟුණේ ජාතික සේවක සංගමයේ අයගෙනි.

1980 වර්ෂනය කඩා බිඳ දැමීමෙන් පසුව පැරණි වෘත්තීය සමිති බොහොමයක් බෝඩි ලැබ බවට පත්වූවාට අමතරව, පොදුවේ වෘත්තීය සමිති ව්‍යාපාරය ම දුර්වල තත්වයකට ඇද වැටිණි. යම් බලයක් ප්‍රදර්ශනය කළ හැකි වෘත්තීය සමිති ලෙස පැවැතියේ වතු වෘත්තීය සමිතියක් ලෙස ලංකා කම්කරු කොංග්‍රසය, රජයේ වෛද්‍ය හිලධාරීන්ගේ සංගමය, රාජ්‍ය සේවා ලෙද සංගමය, ලංකා බැංකු සේවක සංගමය, තැපැල් හා විදුලි සංදේශ හිලධාරීන්ගේ සංගමය වැනි සංගමී කීපයක් පමණි.

1980 වර්ෂනයෙන් පසු ඇති වූ තත්වයක් වතුයේ එලෙක් තමන් සඳුපා මැදිහත් වී වෘත්තීය සමිති තහනම්වා ඉදිරිපත් කොවූ ජ.වී.පෙ විසින් වෘත්තීය සමිති ආරම්භ කිරීමයි. 1983 දී තහනම් කරන විට ධම් සීමිත බලයක් සහිත වෘත්තීය සංගමී සමූහයක් මෙන් ම සමස්ත ලංකා වෘත්තීය සමිති සම්මේලනය ඇති කර ගැනීමට මවුපාර වැකි වී තිබිණි. 1980 වර්ෂනයට පෙර වෘත්තීය සමිති තුළ වැඩකොට ඒවායේ බලය ඇද්ලීමේ ක්‍රමය අනුගමනය කළ ජවිපෙ තමන්ගේ වෘත්තීය සමිති හඳන ස්ථාවරයකට මාරු වූයේ වර්ජනයෙන් පසු ඉතිරි වූ බොහෝ වෘත්තීය සමිති තුළ බලය අල්ලා ගැනීමෙන් ඇති වැඩක් නැතැයි යන හැඟීම නිසා වන්නට ද පිළිවන. ඔවුන්ගේ වෘත්තීය සමිති පිළිබඳ සටන් පාඨය වූයේ, වෘත්තියට සමිතියක්, කම්කරු පන්තියට ඔධසඥපානයක් යන්නයි. ජ.වී.පෙ අදත් එම සටන් පාඨයට අනුව කටයුතු කරමින් සිටින අතර පෞද්ගලික අංශයේ වෘත්තීය සමිති කේෂ්ත්‍රයේ ප්‍රමුඛයා බවට ඔවුන්ගේ අන්තර් සමාගමී සේවක සංගමය පත් වෙමින් තිබෙනු දක්නට පුළුවන.

1980 වර්ෂනයෙන් පසු කම්කරු පන්ති ව්‍යාපාරය තුළ අලුත් ආකෘතියක් බිහිවනු දක්නට ලැබිණ. ඒ කම්කරු පන්තියේ ඒකාබද්ධ පෙරමුණු ඇති වීමයි. අද වන විටත් මෙම ඒකාබද්ධ පෙරමුණු කම්කරුවන් අතර අවශ්‍ය අංශයක් බවට පත්ව තිබෙනු පෙනේ. ඒවා හිමි කිරීමේ මූලික ගෞරවය හිමි වන්නේ ජ.වී.පෙට යැයි කිව හැකි ය. අද වන විටත් දුර්වය ඒකාබද්ධ පෙරමුණ. තැපැල් ඒකාබද්ධ පෙරමුණ ආදී වශයෙනුත්, පෞද්ගලිකරණ අභියෝගය හමුවේ එම ආයතන සුරැකීමේ ඒකාබද්ධ පෙරමුණු හැටියටත් වෘත්තීය සමිති එක්ව කටයුතු කරනු දක්නට ලැබේ. මෙලෙස එක් වීමට බල කරන කොන්දේසිය බවට පත්ව ඇත්තේ බීඳී විසිදී ගොස් ඇති වෘත්තීය සමිතියලට, තනිව අභියෝගයන්ට මුහුණ දීමට ඇති නොහැකියාවයි.

අද වන විට රාජ්‍ය අංශය වේගයෙන් හකුළුවා දමමින් තිබෙන තත්වය තුළ පෞද්ගලික අංශය ආර්ථික ක්ෂේත්‍රය තුළ විශාල ඉඩක් හිමිකර ගනිමින් සිටී. මෙම ක්ෂේත්‍රයේ වෘත්තීය සමිති විසින් අත්කර ගැනීම පිළිබඳ ප්‍රශ්නය කාලය පිළිබඳ එකක් බව පෙනෙන්නට තිබේ. අන්තර් සමාගමී සේවක සංගමය ව්‍යාජ වශ වේගය එයට උදාහරණ ලෙස දැක්විමට පුළුවන.

පාලකයින්ගේ පැත්තෙන් දැන් වැඩවර්ජන කඩා කප්පල් කිරීමෙන් ඔබ්බට ගිය ක්‍රියාකලාපයන් කිහියෙක් ම අනුගමනය කරනු දැක ගන්නට පුළුවන. වැඩවර්ජනවලට එරෙහි තහනම් නියෝග ලබා ගැනීමේ ක්‍රමය ඉන් එකකි. වෘත්තීය හිමිකම්වලින් තොර සේවකයන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කිරීම තවත් එකකි. මෙම ක්‍රමය ගෝලීයකරණයේ ම අංගයක් හැටියට කම්කරු පන්තියට එරෙහිව යොදා ගන්නා බව පෙනේ. මෙමඟින් වෘත්තීය සමිති දියකර හැරීම ඉතාමත් හොඳින් කළ හැකි බව පාලකයන් තේරුම්ගෙන ඇති

ඒ.ඊ ගුණසිංහයන් විසින් 1922 දී පිහිටුවන ලද ලංකා කම්කරු සංගමය, මෙරට සංවිධානාත්මක වෘත්තීය සංගමී ව්‍යාපාරයේ ආරම්භය විය. පසුව ඔහු විසින් ම ඇති කරන ලද ලංකා වෙළඳ සේවක සංගමය, ඔහුගේ සභාපතිත්වයෙන් බැංකු සේ-වකයින් ඇති කළ ලංකා බැංකු ලිපිකාර සංගමය ආදී වෘත්තීය සමිති මෙරට ඉතිහා-සයේ කම්කරු පන්තියට නායකත්වය ලබාදුන් දැවැන්ත බලවේග ලෙස පැවතිණි.

සේවකයන්ගෙන් පුරවමින් සිටින බව වෘත්තීය සමිති නායකයෙක් අප සමඟ පැවසී ය. මෙම සේවකයන් බඳවා ගැනීමට එරෙහිව කම්කරු විනිශ්චය සභාවේ පිහිට පැතූ බවත්, කම්කරු විනිශ්චය සභාව මඟින් මේ පිළිබඳ විභාග කොට මෙලෙස බඳවාගනු ලබන සේවකයන් අවුරුද්දකින් පසුව ස්ථිර කරන ලෙස පාලකයන්ට දැනුම් දුන් නමුත් එය ක්‍රියාවට නොනැගෙන බවත් ඔහු පැවසී ය. මෙයට අමතර වශයෙන් ව්‍යාප ශ්‍රේණි ඇති කර සේවකයන්ට එම ශ්‍රේණිවලට උසස් වීම් ලබා දී වෘත්තීය සමිතියෙන් ඈත් කරවීමේ වැඩසටහනුත් ද සමිතර ආයතනවල ක්‍රියාවට නැගෙන බව ද දැන ගන්නට ලැබිණි. මෙලෙස ලබා දෙන උසස් වීම් කිසි ඇදුරු ආර්ථික ලාභයක් නොලැබෙන බව ද පැහැදිලිව ම දැක ගන්නට තිබේ. මෙම තත්වය රාජ්‍ය අංශයේ ද පිළිලයක් බවට පත්වෙමින් තිබෙන බව දැන ගන්නට ඇත.

ගෝලීයකරණ ක්‍රියාදාමය විසින් ලාංකික ගිලධරය හසුරුවන්නේ ද යන සැකය මතුවන ප්‍රකාශයක් පසුගියා දා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කර තිබිණි. එම ප්‍රකාශයට අනුව අප රටේ කම්කරු නීති විදේශීය ආයෝජකයන් හිතකර ලෙස වෙනස් වීය යුතු බව ආණ්ඩුවට අවධාරණය කර තිබිණ. මෙහි දී ඉස්මතු කොට පෙන්වා තිබුණු කාරණාව වූයේ සේවකයන් දොළුවිට දැමීය හැකි තත්වයක් ඇති කිරීම පිළිබඳව වන කාරණාවයි. විදේශීය ආයෝජකයන් හට නිදහසේ මෙරටට පැමිණ හිතුමතේ මෙරට ශ්‍රමය සූරා කෑමටත් අවශ්‍ය වීටක හිතුවක්කාර ලෙස සේවකයන් දොළුවිට දමන්නට හැකි අයුරින් නීති වෙනස් වීය යුතුයැයි කියන්නටත් මහ බැංකුව ඉදිරිපත් වීම ඇදහිය නොහැකි කරුණක් බව පවසන මානව හිමිකම් ක්‍රියාකාරකයෝ ගෝලීයකරණයේ ග්‍රහණයට මුළුමනින් ම ශ්‍රී ලංකා මහ බැංකුව හතු වී ඇතැයි චෝදනා කරති. මෙම නිලධාරීන් සේවය කරන්නේ මෙරට මහජන මුදලින් උගන්වා ඔවුන් ඉහළ නිලවලට යැවූ මෙරට ජනතාව වෙනුවෙන් නොව මූලික ආරම්භදල වැනි ආයතනවල වුවමනාවන්ට අනුව බවට හොයෙකුත් අවස්ථාවල දී නැගුණු චෝදනාව මෙහිදී බැහැර කළ නොහැකි ය.

හේමසිරි සූරියපටබැදි

■

අද වන විට පෞද්ගලික බැංකු ඉහතින් සඳහන් කළ ආකාරයේ අභියෝග, හමුත්, අභියෝගය එල්ල වී ඇති වෘත්තීය සමිති නායකයන් එම තත්වය හඳුනාගත් බවක් දක්නට නොලැබේ.

අද වන විට රාජ්‍ය අංශයේ පෞද්ගලිකරණයට යොමු කොට ඇති ආයතනත්, පෞද්ගලික අංශයේ ආයතනත් වෘත්තීය සමිති බලපෑමෙන් මිදීමේ මුමයක් හැටියටත්, වෘත්තීය සමිති දුර්වල කර දියකර හැරීමේ ක්‍රමයක් හැටියටත් යොදා ගන්නා ප්‍රධානත ම අවිය වී ඇත්තේ වෘත්තීය හිමිකමක් නොමැති සේවකයන්ගේ සේවය ලබා ගැනීමයි. අතිධමි පදනමින් හා කොන්ත්‍රාත් පදනමින් සේවකයන් බඳවා ගැනීම හා පුහුණු වන්නන් ලෙස සේවකයන් බඳවා ගැනීම දැන් මෝස්තරයක් බවට පත් වී තිබේ. මෙහි දී සේවකයන් බඳවා ගැනීම සිදුවන්නේ තාවකාලික පදනමකිනි. බොහෝ විට මොවුන්ගේ සේවා කාලය අවුරුදු දෙකකි. මෙම කාල සීමාව සඳහා දෙවිහක වැටුපක් ගෙවනු ලබන අතර, එම ආයතනවල ස්ථිර සේවකයින් සඳහා මෙම පිරිස සේවයේ යොදවා සමාන සේවයක් ලබාගනී. අද වන විට ඉතවහා ගොස් ඇති විරැකියා ප්‍රශ්නය නිසා ආයතන පාලකයන්ට අවශ්‍ය මේ වරිගයේ සේවකයන් සොයා ගැනීම පිළිබඳ කිසිම ගැටළුවක් පැන නොගෙඟී. මේ අයගේ ඉමය ඉතා අල්ප දීමනාවකට සූරා කනවාට අමතරව, මොවුනට අනෙකුත් ස්ථිර සේවකයන් තුක්ති විඳින හිවාබූ, අතිකාල, පාරිතෝෂික, වෛද්‍යාධාර, ආර්ථසාධක ආදී කිසිදු හිමිකමක් ලබා දෙන්නේ නැත. ලංකාවේ කප්පරක් කම්කරු නීති ඇතත්, එම නීති ක්‍රියාත්මක කරන විනිශ්චය සභා ඇතත් ආයතන පාලකයන් ඒවා තුරිටුවකටවත් ගණන් නොගැනීමේ තත්වය හමුවේ මෙලෙස බඳවා ගනු ලබන සේවකයන්ට ඉමහත් අසාධාරණයක් සිදුවේ. ලංකාවේ ඇති මානව හිමිකම් පිළිබඳ ආකර්ෂණීය නීතිරීති කිසිවක් පෞද්ගලික අංශයට අදාළ නොවන තත්වයක් හමුවේ පෞද්ගලික අංශයේ මේ සේවකයෝ ඉමහත් අසාරණයන් බවට පත්ව සිටිති. වෘත්තීය සමිති දියකර හැරීමට මෙම පිරිස යොදා ගැනීම පිළිබඳව හොරතුරු සොයා අප කළ සමීක්ෂණයක දී මෙම තත්වය බැංකු ක්ෂේත්‍රය තුළ තදින් පැතිර පවතින බව හෙළිවීය.